**මැතිවරණ කොමිෂන් සභාව**
தேர்தல் ஆணைக்குழு
Election Commission
මැතිවරණ මහලේකම් කාර්යාලය, නො.02 සරණ මාවත, රාජගිරිය, ශ්‍රී ලංකාව
தேர்தல்கள் செயலகம், இல.02 சரண மாவத்தை, இராஜகிரிய, இலங்கை
Elections Secretariat, No.02 Sarana Mawatha, Rajagiriya, Sri Lanka

මාධ්‍ය නිවේදනය
ஊடக அறிவித்தல்
MEDIA RELEASE

LAE\2023\ **34**

**2023.02.12**

## පළාත් පාලන ආයතන ඡන්ද විමසීම 2023

## 2023.03.09 වැනි දින පැවැත්වීමට නියමිත පළාත් පාලන ආයතන ඡන්ද විමසීමේදී ඡන්දය ප්‍රකාශ කිරීමට හිමිකම් ඇති සියලුම ඡන්දහිමියන් වෙත හා තැපැල් ඡන්දදායකයන් වෙත කෙරෙන දැනුම් දීමයි.

- එක් ඡන්දදායකයකුට එක් ඡන්දයක් පමණක් හිමි වේ. එනම් එක් ඡන්දදායකයකුට එක් ඡන්ද පත්‍රිකාවක් පමණක් නිකුත් කෙරේ.
- මෙම ඡන්ද විමසීමේ දී ඡන්දදායකයන්ට නිකුත් කෙරෙන ඡන්ද පත්‍රිකාවේ තරග කරන පක්ෂවල නම් හා සලකුණු ද, ස්වාධීන කණ්ඩායම් තරහ කරන්නේ නම් ස්වාධීන කණ්ඩායම යන වචන ද හඳුනාගැනීමේ අංක හා සලකුණු ද පමණක් මුද්‍රණය කර තිබේ. අපේක්ෂකයන්ගේ හෝ කොට්ඨාසවල නම් හෝ අංක එහි සඳහන් නොවේ.

ඡන්ද පත්‍රිකා ආදර්ශ ආකෘතිය

| | | |
|---|---|---|
| "අ" පක්ෂය | * | |
| "ආ" පක්ෂය | * | |
| "ඇ" පක්ෂය | * | |
| ස්වාධීන කණ්ඩායම 1 | * | |
| ස්වාධීන කණ්ඩායම 2 | * | |

- ඡන්දය ප්‍රකාශ කිරීමේ දී, ඔබ කැමති පක්ෂයේ නම, සලකුණ හෝ ස්වාධීන කණ්ඩායම යන වචන ද හඳුනාගැනීමේ අංක හා සලකුණ ඇති තීරුවේ සලකුණට දකුණෙන් ඇති ඉඩ කොටසේ එකම එක කතිරයක් පමණක් (X) සලකුණු කරන ලෙස කාරුණිකව ඉල්ලා සිටිනු ලැබේ.
- ඡන්ද පත්‍රිකාවේ වෙනත් කිසිම සලකුණක් යෙදීමෙන්, ඇඳීමෙන් හෝ ලිවීමෙන් වැළකී සිටීම අත්‍යවශ්‍යය. මක්නිසාද යත් එසේ කිරීම එනම්, විවිධ සලකුණු ඇඳීම, ලකුණු කිරීම ඡන්දදායකයා හඳුනාගැනීමට හැකිවීම සඳහා කරන ලද උත්සාහයක් සේ සැලකිය හැකි බැවිනි.

***ඡන්දය දීම සඳහා එකම එක කතිරයක් (X) පමණක් භාවිතා කරන්න.***

මැතිවරණ කොමිෂන් සභාවේ නියමය පරිදි,

**සමන් ශ්‍රී රත්නායක**
මැතිවරණ කොමසාරිස් ජනරාල්